**බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව**

**මොණරාගල දිස්ත්‍රික්කය**

**-------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**----------------**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**---------------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 10 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 06 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජූලි 22 වැනි දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 **මතය**

**---------**

**මෙම** වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට බඩල්කුඹුර ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**--------------------------------------**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

**----------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි 08 ක්, මෝටර් රථ හා කරත්ත 02 ක්, පුස්තකාල පොත් 310 ක්, හා පරිගණක හා උපාංග 02 ක වටිනාකම් ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම් ගතකර තිබූ රු. 119,000 ක වටිනා අත්ට්‍රැක්ටරය 2015 ජුනි 25 දින භෞතික පරීක්ෂාවේදී විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1.3.2 **<u>නොසැසඳු පාලන ගිණුම්</u>**

ගිණුම් විෂයන් 11 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 37,432,035 ක් වූ අතර ලේඛන හා උපලේඛන අනුව ශේෂය රු. 9,512,255 ක් විය.

1.3.3 **<u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>**

(අ) දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් පවතින ලැබිය යුතු ගිණුම් හා පෙර ගෙවුම් ශේෂ පිළිවෙලින් රු. 47,861 ක් හා රු. 83,719 ක් සමාලෝචිත වර්ෂයේදී හඳුනාගෙන නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල් සහ ගෙවිය යුතු විගණන ගාස්තු පිළිවෙලින් රු. 374,812 ක් සහ රු.289,759 ක් වුවද සමාලෝචිත වර්ෂයේදීද ඒවා නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

1.3.4 **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 11,612,954 ක වත්කම් විෂයන් 04 ක්, වගකීම් විෂයයන් 01 ක්, ආදායම් විෂයය හා වියදම් විෂයය විගණනයේදී සතුටුදායක ලෙස සත්නිරීක්ෂණ කිරීමට නොහැකිවිය.

1.3.5 **<u>නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.</u>**

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | **<u>නීති,රීති රෙගුලාසි වලට යොමුව</u>** | **<u>අනුකූල නොවීම</u>** |
|---|---|---|
| (අ) | **<u>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත</u>** | |
| | i. 19 (1)(i) වගන්තිය | සමාලෝචිතවර්ෂයේ පරිගණක පුහුණු නිලධාරීන් 02 කු බඳවාගෙන රු. 63,000 ක දිමනාවක් සභා අරමුදලින් ගෙවා තිබුණද, පළාත් පාලන කොමසාරිස්ගේ ලිඛිත පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | |
|---|---|
| ii. 132 (ඒ) සහ (ඔ) වගන්තිය | අමාත්‍යවරයාගේ අනුමැතිය ලබානො ගෙන රු. 19,000 ක වියදමක් දරා තිබුණි. |
| iii. 158 හා 159 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.25,782,175 ක් වූ හිග ආදායම් අයකර ගෙන නොතිබුණි. |

## 02. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 3,043,204 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 154,709 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ අඩුවීම රු. 2,888,495 ක් විය.

### 2.2 <u>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</u>

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,888,495 ක අඩුවීමක් නිරීක්ෂණය වූ අතර ඒ පිළිබඳව විග්‍රහයක් පහත දැක්වේ.

| පුනරාවර්තන ආදායම | 2014 | 2013 | විචලනය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,627,548 | 760,286 | 867,262 |
| කුලී ආදායම් | 2,138,410 | 2,258,762 | (120,352) |
| බලපත්‍ර ගාස්තු | 130,024 | 942,615 | (812,591) |
| සේවා සඳහා ගාස්තු | 739,216 | 379,825 | 359,391 |
| දඩ හා වරෙන්තු ගාස්තු | 1,031,822 | 1,624,794 | (592,972) |
| වෙනත් ආදායම් | 697,861 | 134,410 | 563,451 |
| ආදායම් ආධාර | 14,914,269 | 11,709,900 | 3,204,369 |
| | | | ------------ |

3,468,558

| | | | | |
|---|---|---|---|---|
| <u>පුනරාවර්තන වියදම</u> | | | | |
| වැටුප් හා දීමනා | 17,697,302 | 14,120,789 | (3,576,513) | |
| ගමන් වියදම් | 410,260 | 280,145 | (130,115) | |
| සැපයුම් හා උපකරණ | 984,469 | 1,283,775 | 299,306 | |
| ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තුව | 1,856,061 | 471,233 | (1,384,828) | |
| ප්‍රවාහ සම්බන්ධතා හා සේවා | 3,198,239 | 1,628,603 | (1,569,636) | |
| පොලී ගෙවීම් | - | 7,500 | 7,500 | |
| ආධාර මුදල් දායක මුදල් හා සහනාධාර | 25,000 | 23,398 | (1,602) | |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 151,023 | 149,858 | (1,165) | |
| | | | ------------ | |
| | | | | (6,357,053) |
| | | | | -------------- |
| මූල්‍ය ප්‍රතිඵලයේ අඩුවීම | | | | **2,888,495** |
| | | | | ======== |

## 2.3 <u>ආදායම් පරිපාලනය</u>

### 2.3.1 <u>වරිපනම් බදු</u>

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 140 (1) වගන්තියේ විධිවිධාන පරිදි 2006 වර්ෂයෙන් පසු වරිපනම් බදු තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.3.2 <u>බදු කුලී</u>

(අ) ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත 2008 වර්ෂයේ ඉදිකරන ලද බඩල්කුඹුර වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 16 ක් මේ දක්වා බදු දීමට කටයුතු කර නොතිබුණි.

(ආ) බඩල්කුඹුර නගරයේ පිහිටි අංක 04 දරන එළ හරක් මස් කඩය 2012 වර්ෂයේදී බදු දීමට කටයුතු කර නොතිබුණි. 2011 වර්ෂයේදී එම දේපල රු. 1,360,500 ට බදුගෙන තිබු බදුකරු වෙත 2012 වර්ෂයේදී ශීත කළ එළහරක් මස් වෙළඳසැලක්

පවත්වාගෙන යාම සඳහා රු. 3,300 ක වෙළඳ බලපත්‍රයක් නිකුත් කිරීම නිසා සභාවට රු.1,496,550 ක (2011 වර්ෂයේ ටෙන්ඩර් මුදල වන රු. 1,360,500 සහ සියයට 10 වැඩි කිරීම වන රු. 136,050 යන දෙකෙහි එකතුව) ආදායමක් අහිමි වී තිබුණි.

(ඇ) අංක 09 එළ හරක් මස් කඩය සහ අළුපොත නගරයේ ගවමස් වෙළඳාමේ අයිතිය සමාලෝචිත වර්ෂයේදී බදු දීමට කටයුතු කර නොතිබුණි.

2.3.3 **සම්ප්‍රේෂණ කුළුණු ආදායම්**

2006 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ඉදිකරන ලද සම්ප්‍රේෂණ කුළුණු 07 න් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු හිඟ මුදල රු.87,000 කි.

2.3.4 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ ආදායම රු. 963,051කි. විස්තර පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 140,461 |
| මුද්දර ගාස්තු | 822,590 |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

3.1.1 සමාලෝචිත වර්ෂයේදී අංක ආර්ඩී-4629 දරන ට්‍රැක්ටර් රථයට ඉන්ධන ලීටර් 819 ක් යෙදවීම වෙනුවෙන් රු.98,412 ක් සභා අරමුදලින් වැය කර තිබුණ ද ධාවන සටහන් ඉදිරිපත් නොකෙරුණි. මෙම ට්‍රැක්ටර් රථය ධාවනය කිරීම සඳහා රියදුරන් 03 කු විසින් ඉන්ධන අණවුම් ලබාගෙන තිබූ අතර ඔවුන්ට සමාලෝචිත වර්ෂයේදී දළ වැටුප් අතිකාල සහ නිවාඩු දින වැටුප් ලෙස රු. 944,804 ක් ගෙවා තිබුණි.

3.1.2 2010 2011, 2013 හා සමාලෝචිත වර්ෂයේ අනියම් හා ආදේශක පදනම් යටතේ රියදුරු, පුස්තකාල භාරකරු,ක්ෂේත්‍ර කම්කරු සහ සෞඛ්‍ය කම්කරු, යන තනතුරු සඳහා බඳවාගෙන තිබූ සේවකයන් 09 දෙනෙකු සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 24 දින ස්ථිර සේවයට පත් කර තිබුණ අතර අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් වී නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ ද දළ වැටුප් සේවක අර්ථ සාධක සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් ලෙස රු. 1,162,815 ක් ගෙවා තිබුණි.

3.1.3 විදුලිබල අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති ලිපියේ 2.1 වගන්තිය ප්‍රකාරව වීථි ලාම්පු ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සඳහා ගාස්තු ගෙවීමේ පදනම මත පළාත් පාලන ආයතන වීථි පහන් ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සඳහා සේවා සැපයුම් කරුවෙකු ලෙස කටයුතු කළ යුතු වුවත්, එසේ සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලෙන් රු. 488,955ක වියදම් දරා තිබුණි. වීථි ලාම්පු ස්ථාපනය කිරීමේදී ස්ථාපන ක්‍රමය සවිකළ යුතු ලාම්පු වර්ගය, සංඛ්‍යාව යනාදිය පිළිබඳව මෙම ලිපිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

හුදකලා ගම්මාන වැඩ සටහනේ ප්‍රතිපාදන මත මාර්ග 09 ක ජල සැපයුම් දීර්ඝ කිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කාර සමිති 09 කට සමාලෝචිත වර්ෂයේදී රු. 6,202,844 ක් ගෙවා තිබුණද විගණන දිනය වූ 2015 ජූලි දින වන විටත් ජල සැපයුම ලබාදී නොතිබුණි. අගල් 2 (මිලි මීටර් 63) දිග මීටරයකට අනුමත රේටය වූ රු. 931 කට වැඩියෙන් වූ රු. 1,047 බැගින් ජල නල මාර්ග 04 ක් සඳහා රු. 359,832 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 04. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය